මන්නාරම නගර සභාව

මන්නාරම දිස්ත්‍රික්කය

-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2013 නොවැම්බර් 27 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මන්නාරම නගර සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මන්නාරම නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

ගිණුම්කරණ විෂයයන් දෙකක එකතුව වූ රු.25,423 ක් මූල්‍ය ප්‍රකාශ වල අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

---

එකතුව රු.12,878,020 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් සඳහා අවශ්‍ය වූ තොරතුරු විගණනයට ලබා නොදීම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්

---

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) නගර සභා ආඥා පනතේ vii පරිච්ඡේදයේ 159(1) වගන්තියේ දක්වා ඇති පරිදි කලින් කලට වාර්ෂික වටිනාකම මත වෙළඳ බලපත්‍ර ගාස්තු නිශ්චය කොට නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 700(5) විධිවිධාන පරිදි ටෙන්ඩර් මණ්ඩල තීරණ පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කොට නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 702(3) විධිවිධාන පරිදි ගිවිසුම් පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ වලට අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නගර සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,504,104 ක් වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,341,208 ක් විය.

2.2 මූල්‍ය කළමනාකරණය

---

(අ) අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය යථාර්ථ පදනමක් මත පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශ වලට අනුව සමාලෝචිත වර්ෂය තුලදී මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයක් පෙන්නුම් කෙරුණු නමුත් අතිරික්ත ආදායම සහා බල ප්‍රදේශය තුල සංවර්ධන කටයුතු සඳහා යොදවනු පිණිස අයවැය සංශෝධනයක් සිදු කොට නොතිබුණි.

2.3 ආදායම් පරිපාලනය

---------------------------

2.3.1 අයවැයගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම

--------------------------------------------------------------

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟහිටි ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | අයවැයගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| i. වරිපනම් හා බදු | 1,450,000 | 582,341 | 3,670,899 |
| ii. බදු කුලි | 8,065,000 | 7,392,390 | 4,367,915 |
| iii. බලපත්‍ර ගාස්තු | 3,255,500 | 3,718,595 | - |
| iv. වෙනත් ආදායම් | 36,612,300 | 19,935,112 | 1,267,529 |

2.3.2 කුලී

--------

දීර්ඝ කාලයක් තිස්සේ හිඟ හිට ඇති රු.116,500 කුලී මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.3.3 වෙනත් ආදායම්

---------------------

(අ) අවුරුදු පහකට අධික කාලයක් තිස්සේ හිඟ හිට ඇති රු.185,931 ක් වූ කසල ශෝධන ගාස්තු 2012 වසර අවසානය දක්වාත් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ආ) දීර්ඝ කාලයක් තිස්සේ හිඟ හිට ඇති රු.525,418 ක් වූ බදුකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.4 මුද්දර ගාස්තු

------------------

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් 2012 දෙසැම්බර් 31 දිනට රු.26,789,126 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. මෙම මුදල් අයකර ගැනීම සඳහා පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

2.4 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

-----------------------------------------------------

සභාව විසින් භාවිතයට නොගත් සභාවට අයත් වාහන 07 ක් ආරක්ෂිත ස්ථානයක ගාල්කර නොතිබුණි.

2.5 අනාර්ථික ගනුදෙනු

--------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2012 වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුල ස්ථිර මුරකරුට වැටුප් වශයෙන් රු.195,795 ක් ගෙවා තිබූ නමුත්, එම කාල සීමාවටම අදාලව පෞද්ගලික ආරක්ෂක සේවාවකට සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි.

(ආ) ස්ථාන පහක වූ වීථි ලාම්පු සඳහා අවම ගාස්තු වශයෙන් රු.11,520 ක් ගෙවා තිබූ නමුත් එම ලාම්පු අක්‍රිය ඒවා විය.

(ඇ) විදුලි බිල්පත් නිරවුල් කිරීම පමාවීම මත රු.6,885 ක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි.

2.6 කල් ඉකුත් වූ තැන්පතු

-----------------------------

දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන රු.1,502,097 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.7 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ජාතික ජලසම්පාදන මණ්ඩලයට ගෙවිය යුතු 2008 වර්ෂයේ සිට පැවත එන රු.3,804,719 ක මුදලක් නිරාකරණය කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) වසර හයකට අධික කාලයක් තිස්සේ පැවත එන රු.138,290 ක් වූ සතොස ආයතනයෙන් ලැබිය යුතු හිඟ ගෙවල් කුලී මුදල අයකරගෙන නොතිබුණි.

(ඇ) නගර සභා පුස්තකාල ගොඩනැගිල්ලේ කොටසක් රු.10,000 ක මාසික කුලියක් මත කුලියට ලබා දී තිබූ නමුත් 2012 පෙබරවාරි 04 දින සිට ඉදිරිය කාල පරිච්ඡේදය සඳහා ලැබිය යුතු කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වර්ෂ 1984 සිට 2011 දක්වා වූ කාලයක් තිස්සේ බේරුම් කර නොතිබූ රු.1,660,547 ක් වූ අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.8 කාර්ය සාධනය

-------------------

අයවැය තුලින් සංවර්ධන ව්‍යාපෘති 15 ක් සඳහා රු.5,000,000 ප්‍රතිපාදන ලබා දී තිබූ නමුත් ක්‍රියාත්මක කර තිබුනේ ව්‍යාපෘති 02 ක් පමණි.

2.9 අභ්‍යන්තර විගණනය

--------------------------

සභාවේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් රැස්කිරිම

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ගිණුම්කරණය

(ඈ) මානව සම්පත් කළමනාකරණය

(ඉ) පරිත්‍යාග

(ඊ) වාහන උපයෝජනය

(උ) මිශ්‍ර6 තැන්පතු

(ඌ) අයවැය.